# ත්‍රිපිටක ග්‍රන්ථාරූඪයේ දී මාතලේ අලෝක විහාරයට සහය වූ විහාර සංඛයක් පිළිබඳ කෙරෙන ඓතිහාසික විමසුමක්

**ගල්කුලමේ උපරතන හිමි**

මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ
upa071@gmail.com

## හැඳින්වීම

ලාංකේය ඉතිහාසය තුළ ඓතිහාසික කන්ද උඩරට ප්‍රදේශයට වැදගත් ස්ථානයක් හිමි වේ. මේ තත්ත්වය කන්ද උඩරට අවසන් රාජධානිය තෙක් ම දක්නට ලැබීම විශේෂත්වයකි. කන්ද උඩරට උත්තර බෑවුමේ පිහිටි මාතුල දනව්ව මහතලය, මාතුල රට, මහතලේ යන නම්වලින් හැඳින්වෙන මාතලේ ප්‍රදේශය ඉතිහාසයේ සිට ම සමාජ සංස්කෘතික වටිනාකමක් සහිත ප්‍රදේශයක් වි ය.

ක්‍රිස්තු පූර්ව 3 වැනි සියවසේ සිදු වූ මහින්දාගමනය හරහා ථෙරවාදී සම්ප්‍රදාය මෙ රට ස්ථාපිත වුව ද පසුකාලීන ව ඵ නම් වලගම්බා පාලන සමයේ (ක්‍රි.පූ. 103-88,77) සිදුවන නිකාය භේදයේ ආරම්භයත් සමඟ බුදුදහමේ පරිහානි තත්ත්වයක් වර්ධනය වි ය. වලගම්බා රජුගේ දෙ වැනි රාජ්‍ය පාලන සමය තුළ සිදු වූ මේ තත්ත්වය හේතුවෙන් ශාසනය තුළ වෛතුල්‍යවාදී අදහස් පැතිරෙන්නට වි ය. ඊට සමගාමී ව සිදු වූ බැමිණියා සායේ බලපෑම ද හේතුවෙන් ශාසන චිරස්ථිතිය උදෙසා භික්ෂූන් වහන්සේලා මෙතෙක් මුඛ පරම්පරාණුගත ව රැකගත් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීමට ගත් තීරණය මෙ රට ශාසනයේ වැදගත් කඩයිමක් සේ සැලකිය හැකි ය. මෙම ඓතිහාසික සිදුවීම මාතලේ ආලෝක විහාරය කේන්ද්‍රගත ව සිදුවීම මෙම ප්‍රදේශයේ ඓතිහාසික වටිනාකමට තවත් හේතුවක් වී ඇත.

## අරමුණු

මෙම අධ්‍යයනය ප්‍රධාන අරමුණු කිහිපයක් මුල්කරගෙන සිදු කෙරේ. ඒවා නම්,

- ත්‍රිපිටක ග්‍රන්ථාරූඪය සම්බන්ධයෙන් මැදිහත් වූ සෙසු විහාරස්ථාන හඳුනා ගැනීම
- ත්‍රිපිටක ග්‍රන්ථාරූඪ මාතලේ ආලෝක විහාරය ආශ්‍රිත ව සිදු වූ බව තහවුරු කිරීම
- මාතලේ පුරවරයේ දක්නට ලැබෙන ඓතිහාසික පසුබිම පිළිබඳ අවබෝධයක් ලබාදීම

## පර්යේෂණ ගැටළුව

ත්‍රිපිටක ග්‍රන්ථාරූඪ කිරීමේ දී මාතලේ ආලෝක විහාරයට පරිබාහිර ව ඒ සඳහා දායකත්වය සැප යූ සෙසු පාර්ශව හෝ විහාරස්ථාන කවරේද යන්න විමසීම මෙම පර්යේෂණයේ පර්යේෂණ ගැටළුව වී ඇත.

## අධ්‍යයන ක්‍රමවේදය

මෙම පර්යේෂණය සඳහා ඓතිහාසික මූලාශ්‍ර මෙන් ම පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ. ඓතිහාසික මූලාශ්‍ර අතර සාහිත්‍ය මූලාශ්‍රවලට මුල් තැනක් ලබාදෙන අතර දීපවංශය, මහාවංශය, නිකාය සංග්‍රහය, සාරාර්ථ සංග්‍රහය ආදී කෘති ඒ අතර ප්‍රධන වෙයි. මීට අමතර ව තත් විහාරස්ථානවල දක්නට ලැබෙන ලෙන් ලිපි, කටාර ලිපි ආදිය කෙරෙහි ද අවධානය යොමු කර ඇත. තව ද සහභාගීත්ව

නිරීක්ෂණය යටතේ ඒ ඒ විහාරස්ථානවල නෂ්ඨාවශේෂ ද මෙහි දී පරීක්ෂණයට භාජනය කෙරේ.

නූතන ලේඛකයන් විසින් රචිත කෘතී ද මෙහි දී පරිශීලනය කර ඇති අතර ජනප්‍රවාද කෙරෙහි ද අවධානය යොමු කර ඇත. මීට අමතර ව මේ සම්බන්ධයෙන් මනා දැනුමක් ඇති ශාස්ත්‍රඥයින්ගේ අදහස් ලබාගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා ක්‍රමය ද භාවිත කර ඇත.

**විමර්ශන**

ක්‍රි.පූ. 3 වැනි ශතවර්ෂය ලාංකේය ඉතිහාසයේ සංධිස්ථානයක් සේ සැලකිය හැකි ය. කුමක් නිසා ද යත් දේවානම්පියතිස්ස රජ සමයේ (ක්‍රි.පූ. 263) දී මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රමුඛ ධර්මදූත කණ්ඩායම මෙ රටට වැඩම කරවීම ය. මහින්දාගමනයත් සමඟ මෙ රටට දායාද වූ ත්‍රිපිටකය භික්ෂූන් විසින් මුඛ පරම්පරානුගත ව පවත්වාගෙන එනු ලැබූහ. බුද්ධ පරිනිර්වානයෙන් සියවස් ගණනක් ගතවුවත් ත්‍රිපියකය ග්‍රන්ථාරූඪ කර තබන්නට අවැසි ප්‍රබල සාධකයක් ප්‍රථම, දෙවන, තුන් වැනි සංඝායනාවල දී මතු වූ බවක් දක්නට නොලැබේ. ක්‍රි.ව. පළමු වැනි සියවස සමස්ත ලාංකේය ආර්ථික දේශපාලනික සමාජ ආගමික පසුබිම ම වෙනසකට භාජනය කළ කාල පරිච්ඡේදයක් වි ය. වලගම්බා රාජ්‍ය ද්‍රවිඩ ආක්‍රමණිකයන්ගේ ආක්‍රමණයට ගොදුරුවීමත් වසර 13ක් පුරා පැවති බැමිණිතියා සායත් මේ සමස්ත පරිවර්තනයට ඉවහල් වි ය. මේ කාල වකවානුවේ ත්‍රිපිටක ධාරී ක්ෂීණාශ්‍රවයන් වහන්සේලා රටහැර පලාගිය අතර ඇතැම් භික්ෂූන් වහන්සේලා දැඩි දුෂ්කරතා මධ්‍යයේ වනගත වී ත්‍රිපිටකය ආරක්ෂාකල බව වංශකතාවලින් අනාවරණය වේ.

වසර 12 ක තියගයෙන් අනතුරු ව වලගම්බා රජු සේනා සංවිධාන කොට ලංකා රාජ්‍ය නැවත අත්කරගත් අතර ශාසනයේ විපරීත තත්ත්වයන් ඉස්මතුවන්නේ මේ කාල වකවානුව තුළ ය. වලගම්බා රජුට පෞද්ගලික වශයෙන් උපකාර කළ මහාවිහාරික කුපික්කල තිස්ස හිමියන්ට පෞද්ගලික පූජාවක් වශයෙන් අභයගිරිය ඉදිකොට පූජා කිරීම මීට ආසන්නතම හේතුව වි ය. පසුව මෙය නිකාය භේදයක් දක්වා වර්ධනය වූ අතර එවක් පටන් මහා විහාරය ථේරවාදී සම්ප්‍රදායේ මූලස්ථානය ලෙසත්, අභයගිරිය වෛතුල්‍යවාදයේ මූලස්ථානය ලෙසත් ප්‍රකට වි ය.

මෙ කල මහාවිහාරික භික්ෂූන්වහන්සේලා ශාසනයේ පරිහානියත් මිනිසුන්ගේ බුද්ධි පරිහානියත් දැක මෙ තෙක් කල් මුඛ පරම්පරානුගත ව රැකගෙන ආ ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කර ආරක්ෂා කළ යුතුබවට තීරණය කරන ලදහ. අනුරාධපුරය අගනගරය වුවත් ඒ සඳහා සියලු පහසුකම් හා රාජ්‍ය අනුග්‍රහය ද එහි තිබිය දී වළගම්බා රජු අභයගිරියට ප්‍රමුඛස්ථානය ලබාදීම තුළ ත්‍රිපිටක ග්‍රන්ථාරූඪය වෙනත් ප්‍රදේශයකට රැගෙන යෑමට සිදු වි ය. ආරක්ෂාව අමුද්‍රව්‍ය සපයාගැනීමේ පහසුව සැලකිල්ලට ගත් නිසාදෝ මලය දේශයේ ආලෝක විහාරය මේ සඳහා තෝරාගත් බව වංශකථාවලින් අනාවරණය වේ.

ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪය මාතලේ ආලෝක විහාරයේ දී සිදු විය යන්න පිළිගෙන ඇතැත් නූතන ඉතිහාස කථිකාවත තුළ එය කෑගලු දිස්ත්‍රික්කයේ කරිඳුපොනට හා මොළගොඩට ආසන්න ව ඇති අලුලෙනෙහි සිදුකළ බවට මත ඉදිරිපත් වි ඇත. ඓතිහාසික සාධක අනුව හා ඉතිහාසඥයින් හා පුරාවිද්‍යාඥයින්ගේ පිළිගැනීම අනුව ත්‍රිපිටක ග්‍රන්ථාරූඪය මාතලේ සිදු වූ බව තර්ක විරහිතව පිළිගත හැකි ය.

මාතලේ ආලෝක විහාරය පමණක් මේ සඳහා සම්බන්ධ වී ඇද්ද යන්න මෙම අධ්‍යයනයේ දී අවධානය යොමුකළ මූලික කරුණ වි ය.

මහරහතන් වහන්සේලා 500 නමක් වසර තුනකුත් මාස තුනක් හා සති තුනක් තුළ මේ භාරධූර කාර්යය සිදුකොට ඇත. මේ කාර්යය සඳහා ආලෝකවිහාරයට ගොදුරු විහාරස්ථාන ගණනාවක් ම සහාය පළකොට ඇති බව මූලාශ්‍රය ඇසුරෙන් පැහැදිලි කරගත හැකි ය. ඇඹිල්ල විහාරය, රජමහ කොහොන් වෙහෙර, කුරුවා බෝගම්බර විහාරය, තල්ගහගොඩ විහාරය යන විහාර

හතර ද එවකට ත්‍රිපිටක ග්‍රන්ථාරූඪයට සහය පළකොට ඇතිබව සනාථ වේ.

## සමාලෝචනය

ත්‍රිපිටක ග්‍රන්ථාරූඪ කළ මාතලේ ආලෝක විහාරයේ ඇති නශ්ඨාවශේෂ පරීක්ෂා කිරීමෙන් හා ශිලාලේඛන සාධක විමසීමෙන් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪය සම්බන්ධයෙන් තොරතුරක් සපයාගත නොහැක. මෙහි සඳහන් කොහොන් විහාරය අලු විහාර සංඝායනාවේ මූලිකත්වය දරූ කොහොන් තිස්ස නම් හිමිනමක් විසූ විහාරයක් බව අස්ගිරි තල්පතින් අනාවරණය වේ. රහතුන් වැඩසිටි තොට>රහත්තොට>රත්තොට වී ඇති බව රත්තොට ග්‍රාමනාම විමසීමෙන් පැහැදිලි වේ. ඉහත සඳහන් කුරුවා බෝගම්බර විහාරය රත්තොට ආසන්නයේ පිහිටා ඇත. තව ද මෙහි පවතින වෙනත් ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක සාදක ද සැලකිල්ලට ගැනීමෙන් මෙම ස්ථානවල ත්‍රිපිටකධාරී භික්ෂූන් වැඩසිටින්නට ඇති බව කල්පනා කළ හැකි ය. ඇඹිල්ල හා තල්ගහගොඩ විහාර සම්බන්ධයෙන් ද පවතින මත සැලකිල්ලට ගැනීමෙන් පැහැදිලි වන්නේ ත්‍රිපිටක ග්‍රන්ථාරූඪය සඳහා මෙම විහාරස්ථාන ද භාවිත වී ඇති බවයි.

### ආශ්‍රෙය ග්‍රන්ථ

විමල හිමි. අඹගහපිටියේ, නිකාය සංග්‍රහය, සෙන්ට්‍රල් ප්‍රින්ටර්ස්, ගම්පොල, 1999

ප්‍රියදර්ශන බණ්ඩාර ආර්. ඩබ්ලිව්. පස්වන ධර්ම සංඝායනාව, (ත්‍රිපිටක ග්‍රන්ථාරූඪ කිරීම) සමගි මුද්‍රණය, 2009

සරණංකර හිමි. අලුවිහාරේ, ඓතිහාසික මාතලේ අලුවිහාරය, කර්තෘ ප්‍රකාශන, මාතලේ, 2013

අමරවංශ, අකුරටියේ, වංසත්ථප්පකාසිනී, මහාවංශ ටීකාව, හේමචන්ද්‍ර දිසානායක ප්‍රකාශන, කැළණිය විශ්ව විද්‍යාලය, 1994

රෝහණධීර, මැන්දිස්. අස්ගිරි තල්පත, සංස්. තරංගි ප්‍රින්ටර්ස්, මහරගම, 1997

Gamage, Siril, Historic Matale " Ed. by Matale District Cultural Board, Department of Government Printing, Colombo, 1984